# රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ

සුදත් සෙනරත්

අනුබුදු මිහිඳු මාහිමියන් වහන්සේ විසින් දල්වා වදාළ සිරිලක දහම් ප්‍රදීපය මහනුවර රජ දවස නිවී යා නොදී සුරක්ෂිත කළෝ අසරණ සරණ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියෝ ය. මායා රටෙහි ශාස්ත්‍රාගම පෝෂණය කිරීම සඳහා රත්මලානේ පුරාණ විහාරස්ථානයට වැඩම කළ ආසිදෙණියේ ධර්මකීර්ති මාහිමියන්ගෙන් ඇරඹි ගුරුගෝල පරපුර තලන්ගම සෝභිත, මරලුවාවේ සෝභිත, අඩුමපේ සෝණුත්තර, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක යන ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගෙන් සමන්විත වූහ. එය වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමියන්ගෙන් බිහි වූ එක් ඇදුරු පරපුරක් විය. විද්‍යාලංකාර සඟපරපුර, කොස්සින්නේ රජමහ විහාර සඟපරපුර හා ගංගොඩවිල විජයාරාම මහා විහාර සඟපරපුර ආසිදෙණියේ ධර්මකීර්ති මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය ප්‍රවේණියට අයත් වෙයි.

ශ්‍රී බුද්ධ වර්ෂ 2370 ක් වූ වෙසඟ පුර දොළොස්වක් පිට තෙළෙස්වක් ලත් සඳුදින හෙවත් ක්‍රි. ව. 1828 ක් වූ මැයි මස 28 වැනි දින රත්මලාන නම් ගමෙහි පින්වත් බිළිඳෙක් ජන්ම ලාභය ලැබී ය. රයිගම් පුර රාජධානිය පැවති කාලයෙහි රයිගම් වැව බැන්දවීමේ කාර්යය විධායක වශයෙන් ක්‍රියා කරමින් විදාන නිලය දැරූ පූර්ව පුරුෂයන්ගෙන් හෙබි රයිගම් විදානේ පරපුරෙහි ජනිත වූ රයිගම විදානේලාගේ දොන් කොර්නේලිස් අප්පුහාමි හා එම ගමෙහි උසස් පෙළපතක ජනිත කුලකාන්තාවක වූ අබේපිටියගේ දෝන අඩියානා හාමිනේ යන දම්පති යුවළ මෙම දරුවාගේ මවුපියෝ වූහ.

එකල නැණවත් ගුණවත් භික්ෂූන් වහන්සේගේ මූලස්ථානයක් ලෙස ප්‍රකට ව තිබූ රත්මලානේ පුරාණ විහාරස්ථානයට මෙම කුල පුත්‍රයා අකුරු කරවීම සඳහා මවුපිය වැඩිහිටියන් විසින් පමුණුවන

© සුදත් සෙනරත්

සංස්: පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, රොමෙල්ලා රසූල්
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය: 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.